**මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය- 2012**
**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව හා

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 1.2 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.2.1 නොසැසඳු ශේෂ

----------------

මාගේ පෙර වර්ෂයේ වාර්තාවේ සඳහන් කළ පරිදි, ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශනවල පවතින අගයන්, සමාන තොරතුරු සපයන අනෙකුත් සම්බන්ධිත ආයතනයන් සමග සංසන්දනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එබැවින් 2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනයන්හි පෙන්නුම් කරන ලද රු. මිලියන 118.76 වන විදේශ අරමුදල් ලැබීම් එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය පවත්වාගෙන ගිය වාර්තා වල පෙන්වූ රු. මිලියන 101.28 වන අරමුදල් ලැබීම් සමග එකග නොවී තිබුණි.

### 1.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

---------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් ඒවා ඉදිරිපත් කර තිබුණේ 2014 සැප්තැම්බර් 23 දිනදීය.

(ආ) ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද පිරිවැය රු. මිලියන 1.19 ක් වූ වත්කම්වල තොරතුරු වාර්තා කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි 756 පරිදි එම වත්කම් භෞතික සත්‍යාපනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2010 ජුලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 ට අනුව ව්‍යාපෘතියේ ගණුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට යටත් කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21 වන වගන්තිය හා 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) හි 05 ඡේදය ප්‍රකාරව, එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ මාසික වාර්තාවක් විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත කාලපරිච්ඡේදය තුලදී කොන්ත්‍රාත්කරුට ගෙවන ලද එකතු කළ අගය මත බදු මුළු වටිනාකම රු. මිලියන 8.3 ක් විය.

## 2. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 2.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2012 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය සඳහා | | 2012 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජාසජනි (JICA) | 14,087 | 17,922 | 1,400 | 62.10 | 99.4 | 76.10 | 118.8 |
| ශ්‍රීලංර | 3,191 | 4,060 | 350 | 40.75 | 65.2 | 63.26 | 96.4 |
| | **17,278** | **21,982** | **1,750** | **102.85** | **164.6** | **139.36** | **215.2** |

2012 වර්ෂය සඳහා රු. මිලියන 1,750 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණත් සියයට 9.4 කට සමාන රු. මිලියන 164.6 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණි. තවද, අපේක්ෂිත කාල පරාසය තුළදී ලබාදී ඇති සම්පත් භාවිතයෙන් අරමුණු ලඟාකරගැනීම සහතික කරගැනීමට සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි වගකීම් තීරණය කිරීම් සහිත මූල්‍ය හා භෞතික ඉලක්ක අවධාරණය කරමින් පරිපූර්ණ විස්තරාත්මක සැලැස්මක් නොමැතිවීම නිසා නිශ්චිත ව්‍යාපෘති කාලය තුළ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට ව්‍යාපෘතියට උපායමාර්ගයක් තිබේද යන්න සැකසහිත බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

## 2.2 භෞතික ප්‍රගතිය

-----------------

ව්‍යාපෘතිය විසින් පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 2.69 සහ 3.53 ක් විය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් නිසා සමස්ත ක්‍රියාකාරකම් වලින් සියයට 91.4 ක් තරම් වූ ප්‍රධාන පැකේජ 4 ක ඉදිකිරීම් වල කිසිදු භෞතික ප්‍රගතියක් පෙන්නුම් නොකෙරුණි.

## 2.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පරිචයක් ලෙස, ව්‍යාපෘති සේවක පාරිශ්‍රමිකය ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතර ව්‍යාපෘතිය එහි පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවාගෙන තිබුණද එසේ ගණනය කළ වැටුප් පිරිවැයෙන් සියයට 20 ක් පොදුකාර්ය වියදම් ලෙස ව්‍යාපෘතියෙන් අය කරනු ලැබේ. 2012 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ව්‍යාපෘතිය විසින් එසේ ගෙවන ලද මුළු පොදුකාර්ය වියදම රු. මිලියන 3.7 ක් විය.